# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2483/19 - 2026 අප්‍රේල් මස 10 වැනි සිකුරාදා - 2026.04.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ද්විතීයික ව්‍යාපාර**

2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත

**53 වන වගන්තිය යටතේ වූ නියමය**

2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ (‘පනත’) 53වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය අනුර කුමාර දිසානායක වන මම, කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාවේ නිර්දේශ සැලකිල්ලට ගෙන සහ අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමෙන් පසුව, මෙම නියමය මගින් -

(අ) අමාත්‍ය මණ්ඩලය විසින් 2026.03.30 දිනැති අංක 26/0621/804/083 දරන තීරණය මගින්, මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති අයදුම්කරුගේ ව්‍යාපාරය ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ද්විතීයික ව්‍යාපාරයක් ලෙස නම් කිරීම අනුමත කර ඇති බවට;

(ආ) ක්‍රමෝපාය වැදගත්කමකින් යුත් ව්‍යාපාරය පවත්වාගෙන යනු ලබන අයදුම්කරුගේ නම මෙහි I වන උපලේඛනයේ දක්වා ඇති පරිදි විය යුතු බවට;

(ඇ) එම ව්‍යාපාරය ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ද්විතීයික ව්‍යාපාරයක් ලෙස සලකනු ලැබීමට හේතු මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති බවට; සහ

(ඈ) අදාළ පැනවීම් යටතේ ප්‍රදානය කරන ලද නිශ්චිත නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් නිශ්චිතව දක්වා ඇති පරිදි විය යුතු අතර, මෙහි III වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති දිනවල දී ආරම්භ විය යුතු බවට සහ ක්‍රියාත්මක වීම අවසන් විය යුතු බවටත්,

නිශ්චිතව දක්වමි.

**අනුර කුමාර දිසානායක,**
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය.

2026 අප්‍රේල් මස 10 වැනි දින
කොළඹ දී ය.

| I වන උපලේඛනය<br>ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ද්විතීයික ව්‍යාපාරයක් ලෙස නම් කරන ලද ව්‍යාපාරයේ විස්තර | | |
|---|---|---|
| 1. අයදුම්කරුගේ නම | තාක්ෂණ ටෙක්නොලොජීස් ප්‍රයිවට් ලිමිටඩ්<br>(THAKSHANA TECHNOLOGIES PRIVATE LIMITED) | |
| 2. බලයලත් තැනැත්තාගේ බලපත්‍ර අංකය | 2403250060 | |
| 3. බලපත්‍රය නිකුත් කළ දිනය | 2024 අගෝස්තු 12 | |
| 4. සුදුසුකම් ලැබීමේ නිර්ණායක | 2025 සැප්තැම්බර් 20 දිනැති අංක 2454/62 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත්කරන ලද, 2025 අංක 01 දරන කොළඹ වරාය නගරය (ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාරය සඳහා නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් ප්‍රදානය කිරීම පිළිබඳ මාර්ගෝපදේශ) නියෝගවල 5 වන නියෝගය. | |
| 5. ව්‍යාපාරික ක්ෂේත්‍රය | තොරතුරු තාක්ෂණය | |
| 6. අපේක්ෂිත විදේශ ආයෝජන ලැබීම් (එ.ජ. ඩොලර්) | වර්ෂය 1 | 50,000 |
| | වර්ෂය 2 | - |
| | වර්ෂය 3 | - |
| | වර්ෂය 4 | - |
| | වර්ෂය 5 | - |
| 7. අපේක්ෂිත රැකියා අවස්ථා (සංඛ්‍යාව) | වර්ෂය 1 | 14 |
| | වර්ෂය 2 | 58 |
| | වර්ෂය 3 | 83 |
| | වර්ෂය 4 | 103 |
| | වර්ෂය 5 | 113 |
| 8. වාණිජ කටයුතු ආරම්භ කිරීම (දිනය) | මෙම *ගැසට්* නියෝගය ප්‍රකාශයට පත්කළ දිනයෙන් මාස 03 කින් | |

## II වන උපලේඛනය
## ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ද්විතීයික ව්‍යාපාරයක් ලෙස සැලකීමට හේතු

2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 53(5) වගන්තිය මගින් විධිවිධාන සලසා ඇති පරිදි, ජාතික යහපත සැලකිල්ලට ගනිමින් හෝ ජාතික ආර්ථිකය දියුණු කිරීම සඳහා කොළඹ වරාය නගරය ස්ථාපිත කිරීමේ සාර්ථකත්වය සහතික කිරීම පිණිස, ව්‍යාපාරය, ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාරයක් ලෙස නම් කිරීමේ දී එම පනතේ 5වන වගන්තියේ දක්වා ඇති කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාවේ අරමුණු සැලකිල්ලට ගනු ලැබ ඇත.

ශ්‍රී ලංකාවේ ලියාපදිංචි සමාගමක් වන තාක්ෂණ ටෙක්නොලොජීස් (පුද්ගලික) සමාගම (Thakshana), මෘදුකාංග සහ දෘඩාංග සංවර්ධන සමාගමකි. ඔවුන් නිෂ්පාදන සංවර්ධන ආයතනවල විකාශනය වන අවශ්‍යතාවලට ගැළපෙන නව්‍ය විසඳුම් ලබාදීම සඳහා කැපවී සිටියි. රැහැන් රහිත සන්නිවේදනය (Wireless communications), උපාංග පදනම් කරගත් අන්තර්ජාලය (IoT), සයිබර් ආරක්ෂණය (Cybersecurity) සහ කෘතිම බුද්ධිය (AI) යන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් තාක්ෂණ සමාගම විශේෂඥතාවක් දක්වයි. එම්බෙඩඩ් පද්ධති ක්‍රමලේඛනය (Embedded System Programming) සහ FPGA ක්‍රියාත්මක කිරීමේ සිට වෙබ් පාදක සංවර්ධනය, යෙදුම් ක්‍රමලේඛනය (Application Programming) සහ සන්නිවේදන පද්ධති පරීක්ෂාව දක්වා විහිදෙන ඔවුන්ගේ විවිධත්වයකින් යුත් සේවා එකතුව, කර්මාන්තයේ පවතින බහුවිධ අභියෝග ජය ගැනීමට ඔවුන් සතු කැපවීම පිළිබිඹු කරයි.

## III වන උපලේඛනය

| *පනතේ II වන උපලේඛනයේ ලැයිස්තුගත පනත්* | | *ප්‍රදානය කරනු ලබන නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම්* | *ආරම්භ වන දිනය* | *අවසන් වන දිනය* |
|---|---|---|---|---|
| 1 | 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත | 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත යටතේ වන ආයතනික ආදායම් බද්ද, සියලු ලාභ සහ ප්‍රතිලාභ මත 7.5%ක සහනදායී බදු අනුපාතයක් යටතේ අය කිරීම. | වාණිජ කටයුතු ආරම්භ කරන දිනය. | වාණිජ කටයුතු ආරම්භ කළ දින සිට වසර 4 කින් |
| 2 | 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත | මෙම පනත යටතේ කිසිදු නිදහස් කිරීමක් හෝ දිරිගැන්වීමක් ප්‍රදානය කරනු නොලැබේ. | අදාළ නොවේ | අදාළ නොවේ |
| 3 | 2022 අංක 11 දරන මුදල් පනත | මෙම පනත යටතේ කිසිදු නිදහස් කිරීමක් හෝ දිරිගැන්වීමක් ප්‍රදානය කරනු නොලැබේ. | අදාළ නොවේ | අදාළ නොවේ |
| 4 | 2005 අංක 5 දරන මුදල් පනත | මෙම පනත යටතේ කිසිදු නිදහස් කිරීමක් හෝ දිරිගැන්වීමක් ප්‍රදානය කරනු නොලැබේ. | අදාළ නොවේ | අදාළ නොවේ |
| 5 | 1989 අංක 13 දරන සුරාබදු (විශේෂ විධිවිධාන) පනත | මෙම පනත යටතේ කිසිදු නිදහස් කිරීමක් හෝ දිරිගැන්වීමක් ප්‍රදානය කරනු නොලැබේ. | අදාළ නොවේ | අදාළ නොවේ |
| 6 | (235 වැනි අධිකාරය වූ) රේගු ආඥාපනත | කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන පරිදි, ව්‍යාපාරයට අදාළ භාණ්ඩ හා සේවා ආනයනය කිරීම් සියල්ලම මෙම පනත යටතේ නිශ්චිතව දක්වා ඇති සියලුම බදු, තීරුබදු සහ අයකිරීම්වලින් නිදහස් කරනු ලැබේ. | මෙම නියෝගය ප්‍රකාශයට පත්කළ දිනය | වාණිජ කටයුතු ආරම්භ කරන දිනය තෙක් |
| 7 | 2011 අංක 18 දරන වරාය සහ ගුවන් තොටුපොළ සංවර්ධන බදු පනත | කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන පරිදි, ව්‍යාපාරයට අදාළ භාණ්ඩ ආනයනය කිරීම් සියල්ලම මෙම පනත යටතේ නිශ්චිතව දක්වා ඇති සියලුම බදු, තීරුබදු සහ අයකිරීම් වලින් නිදහස් කරනු ලැබේ. | මෙම නියෝගය ප්‍රකාශයට පත්කළ දිනය | වාණිජ කටයුතු ආරම්භ කරන දිනය තෙක් |
| 8 | 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත | කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන පරිදි, ව්‍යාපාරයට අදාළ භාණ්ඩ ආනයනය කිරීම් සියල්ලම මෙම පනත යටතේ නිශ්චිතව දක්වා ඇති සියලුම බදු, තීරුබදු සහ අයකිරීම් වලින් නිදහස් කරනු ලැබේ. | මෙම නියෝගය ප්‍රකාශයට පත්කළ දිනය | වාණිජ කටයුතු ආරම්භ කරන දිනය තෙක් |
| 9 | 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම් සහ සූදු බදු පනත | මෙම පනත යටතේ කිසිදු නිදහස් කිරීමක් හෝ දිරිගැන්වීමක් ප්‍රදානය කරනු නොලැබේ. | අදාළ නොවේ | අදාළ නොවේ |
| 10 | 1971 අංක 45 දරන කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පනත | මෙම පනතේ 2 වන වගන්තිය, 11 වන වගන්තිය සහ 12 වන වගන්තියෙන් නිදහස් කිරීම. | මෙම නියෝගය ප්‍රකාශයට පත් කළ දිනය | බලයලත් තැනැත්තාගේ බලපත්‍රයේ වලංගු කාලය අවසන් වූ පසු හෝ එය අවසන් කරනු ලැබූ පසු |
| 11 | (267 වන අධිකාරය වූ) විනෝද බදු ආඥාපනත | මෙම පනතේ 2 වන වගන්තියෙන් නිදහස් කිරීම | මෙම නියෝගය ප්‍රකාශයට පත් කළ දිනය | බලයලත් තැනැත්තාගේ බලපත්‍රයේ වලංගු කාලය අවසන් වූ පසු හෝ එය අවසන් කරනු ලැබූ පසු |

| **III** වන උපලේඛනය (*සම්බන්ධිතයි*) | | | | |
|---|---|---|---|---|
| *පනතේ II වන උපලේඛනයේ ලැයිස්තුගත පනත්* | | *ප්‍රදානය කරනු ලබන නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම්* | *ආරම්භ වන දිනය* | *අවසන් වන දිනය* |
| 12 | 2017 අංක 12 දරන විදේශ විනිමය පනත | 2022 ජුනි මස 3 දිනැති අංක 2282/59 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරන ලද, 2022 අංක 1 දරන විදේශ විනිමය (කොළඹ වරාය නගරය තුළ ආයෝජන) නියෝග හැර, මෙම පනතේ අනෙකුත් සියලුම විධිවිධානවලින් නිදහස් කිරීම | මෙම නියෝගය ප්‍රකාශයට පත් කළ දිනය | බලයලත් තැනැත්තාගේ බලපත්‍රයේ වලංගු කාලය අවසන් වූ පසු හෝ එය අවසන් කරනු ලැබූ පසු |
| 13 | 2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමනය කිරීමේ) පනත | මෙම පනත යටතේ කිසිදු නිදහස් කිරීමක් හෝ දිරිගැන්වීමක් ප්‍රදානය කරනු නොලැබේ. | අදාළ නොවේ | අදාළ නොවේ |

EOG 04 - 0174

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.